ජනපති රාජපක්ෂ විසින් ලෝක සෞඛ්‍ය සංවිධානය හා පැවැත්වූ සාකච්ඡාවක ප්‍රතිඵලයක් වශයෙන් එදිනම සවස ලෝක සෞඛ්‍ය සංවිධානය සයිනොෆාම් එන්නත හදිසි භාවිතය සඳහා අනුමැතිය ලබාදුන් බව, මැයි 10 දින ජනාධිපති මාධ්‍ය ප්‍රකාශකවරයා විසින් ප්‍රකාශ කරන ලදී. කෙසේ නමුත්, ඩේලි මිරර් (05/11) සහ අද (05/12) පුවත් වාර්තාවන්ගෙන් කියැවුණේ, ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් උක්ත කී ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන බවයි. චීනයේ සයිනොෆාම් එන්නත ලොව පුරා හදිසි භාවිතය සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් අනුමත කරනු ලැබුවේ ජනපති රාජපක්ෂ හා පැවති සාකච්ඡාවක ප්‍රතිඵලයක් ලෙසින් නොවන බවට ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ඩේලි මිරර් කළ විමසුමකදී පිළිතුරු ලෙසින් පැවසුණු බව එම පුවත් වාර්තාවන්ගෙන් දැක්විණි.

එම පුවත් වාර්තාවන් ඉදිරිපත්ව තිබියදී වුවත්, අද දින දෙරණ අරුණ වැඩසටහන (05/13) ඔස්සේ, එම නිවේදක සමග දුරස්ථ මාර්ගික කතාබහකට එක් වෙමින් යුධ හමුදාපති ශවේන්ද්‍ර සිල්වා විසින් සිදුකළ ප්‍රකාශය තුළ, "...ජනාධිපතිතුමා පෞද්ගලිකවම ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රධානියාට කතා කරලා අනුමැතිය අරන්, ඊට පැය කිහිපයකට පසුව එන්නත්කරණය ආරම්භ කරනු ලැබුවේ..." යනුවෙන්ද පැවසිණි.

ජනාධිපති මාධ්‍ය ප්‍රකාශක විසින් සිදුකළ එම ප්‍රකාශය නිවැරදි නොවන බවට මාධ්‍ය ඔස්සේම මූලාශ්‍ර සහිතව අභියෝගයට ලක් කෙරී ඇත. ඒ අනුව දෙරණ අරුණ වැඩසටහනේදී ඒ සම්බන්ධයෙන් යුධ හමුදාපතිවරයාගෙන් විමසිය යුතු නොවේද? එසේ විමසිය හැකි වූවා නම්, වඩාත් ඒ පිළිබඳ නිවැරදි තොරතුරක් ජනතාවට ලබාදීමට හැකිවන්නට තිබුණා නොවේද? මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

අදාළ සබැඳි:

https://www.youtube.com/watch?v=rMpAWKS3BuY

**https://www.facebook.com/watch/live/?v=501970037708766&ref=watch_permalink**

#MediaEthicsSL #lka #SinhalaPress #Ada #DailyMirror #deranaaruna